# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2332/03 - 2023 මැයි මස 15 වැනි සඳුදා - 2023.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/80 (32)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

,

සෞඛ්‍ය අමාත්‍ය.

2023 අප්‍රේල් මස 28 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග ආහාර (ලුණු අයඩීනීකරණය කිරීමේ) නියෝග 2023 යනුවෙන් හඳුන්වනු ලබන අතර 2024 ජනවාරි 01 වන දින සිට බලාත්මක විය යුතු ය.

2. මේ නියෝගවල විධිවිධානයන්ට අනුකූලව හැර, කිසිදු තැනැත්තෙකු විසින්, ආහාර සංඝටකයක් ලෙස සහ ආහාර නිෂ්පාදනය සඳහා භාවිත කරන ලුණු ද ඇතුළුව මිනිස් පරිභෝජන කාර්යයන් සඳහා අයඩීනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු නොවන වෙනත් කිසිඳු ආකාරයක ආහාරයට ගන්නා ලුණු වර්ගයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, අලෙවිය සඳහා ගබඩා කිරීම, අලෙවි කිරීම, අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම, අලෙවිය සඳහා නිරාවරණය කිරීම හෝ අලෙවියට තැබීම, ප්‍රවාහනය හෝ බෙදා හැරීම නොකළ යුතුය.

1A - PG 6321 — 4506 (2023/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I වන කොටස

**අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු**

3. (1) (අ) ලුණු ලේවායන් තුළ අයඩීනීකරණය නොකරන ලද ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය කරන්නා වූ, ගබඩා කරන්නා වූ සහ ලුණු ලේවායන්වලින් අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු ප්‍රවාහනය කරන්නා වූ ;

(ආ) වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද ඖෂධ වට්ටෝරුවක් මත, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 119 වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ ඔසුහල්වල විකිණිය හැකි බහාලුමක ග්‍රෑම් සියයකට (100g) නොවැඩි වන ලෙසින් කුඩා බහාලුම්වල අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු විකිණීම සිදු කරන්නා වූ ; සහ

(ඇ) කර්මාන්තශාලාවල කාර්යයන් සඳහා අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු හෝ සාමාන්‍ය ලුණු ආනයනය, ප්‍රවාහනය, ගබඩා කිරීම හෝ භාවිත කරන්නා වූ, සහ

සෑම තැනැත්තකුම ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු, අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කළ ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතු ය.

(2) (1) වන උපනියෝගයේ සඳහන් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සඳහා වූ ඉල්ලුම් පත්‍රය -

(අ) මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය ; සහ

(ආ) අධ්‍යක්ෂවරයා විසින් ඒ කාර්යය සඳහා නිශ්චිතව දක්වනු ලැබිය හැකි අදාළ සියලු ලේඛනවලින් සමන්විත විය යුතු ය.

(3) (අ) අධ්‍යක්ෂවරයා විසින් (4) වන උපනියෝගයට අනුකූලව ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ හැකි ය.

(ආ) අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී, එකී ප්‍රතික්ෂේප කිරීම, ඒ සඳහා වූ හේතු ද සමඟ ඉල්ලුම් පත්‍රය ලැබුණු දින සිට දින තිහක් (30) ඇතුළත ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(4) ලියාපදිංචි කිරීමේ සහතිකය -

(අ) (1) වන උපනියෝගයේ (අ) ඡේදයේ කාර්යයන් සඳහා මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය;

(ආ) (1) වන උපනියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල කාර්යයන් සඳහා මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය; සහ

(ඇ) කලින් ඒ සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කර හෝ අවලංගු කර නැත්නම් මිස සහ එහි නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසිවලට යටත් ව එම සහතිකය නිකුත් කළ දින සිට වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(5) ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් -

(අ) මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති එම ආකෘති පත්‍රයේම පවතින ලියාපදිංචි කිරීමේ සහතිකය කල් ඉකුත්වීමට දින අනූවකට (90) පෙරාතුව ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) අධ්‍යක්ෂවරයා විසින් එම කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ ලේඛනවලින් සමන්විත විය යුතු ය.

(6) අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය මත පිටසනක් තැබීමෙන් ලියාපදිංචි සහතිකය අලුත් කිරීම සිදුකළ යුතු ය.

4. අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු -

(අ) මැටි, සියුම් ගල් හෝ වැලි කැට, සිප්පි කටු කැබලි සහ වෙනත් බාහිර ද්‍රව්‍ය ආදී දෘශ්‍යමාන අපිරිසිදු ද්‍රව්‍යවලින් තොර සුදු හෝ අවසුදු වර්ණයෙන් විය යුතු ය; සහ

(ආ) කැට හෝ කුඩු ආකාරයෙන් විය යුතු යඃ

එසේ වුව ද, කුඩු ස්වභාවයෙන් වූ විට, ආහාර උපදේශක කමිටුවේ නිර්දේශ මත ප්‍රධාන ආහාර බලධරයා විසින් ලිඛිතව අනුමත කරන ලද සිලිකන්ඩයොක්සයිඩ් (INS 551) හෝ වෙනත් ඕනෑම ප්‍රතිකැටිකිරීමේ කාරකයක් අඩංගු කළ හැකි ය.

5. අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණුවල -

(අ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.5 (0.5 mg/kg)ට වඩා ආසනික් (As);

(ආ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.5 (0.5 mg/kg)ට වඩා කැඩ්මියම් (Cd);

(ඇ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් දෙකක (2.0 mg/kg)ට වඩා ඊයම් (Pb); සහ

(ඈ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.1 (0.1 mg/kg)ට වඩා රසදිය (Hg);

අඩංගු නොවිය යුතු ය.

6. කුඩු ස්වභාවයෙන් යුත් අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණුවල -

(අ) (i) තෙතමනය සියයට 0.5කට (0.5%) (m/m): සහ

(ii) වියළි පදනම මත ජලයේ දිය නොවන ද්‍රව්‍යවල ප්‍රමාණය සියයට 0.5 කට (0.5%) (m/m) ට වඩා අඩංගු නොවිය යුතු ය;

(ආ) වියළි පදනම මත සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) සියයට අනූඅටකට (98%) (m/m) වඩා නොඅඩු විය යුතු ය; සහ

(ඇ) අවම වශයෙන් සියයට 95 ක (95%) (m/m) ප්‍රමාණයක් මිලිමීටර් 1ක (1.0mm) {B.S. 16} සිදුරු සහිත පෙනේරයන් තුළින් ගමන් කරවීමට හැකිවිය යුතු ය.

7. අයඩීනීකරණය නොකළ කැට වශයෙන් වන ආහාරයට ගන්නා ලුණුවල -

(අ) (i) තෙතමනය සියයට හයකට (6%) (m/m) වඩා; සහ

(ii) වියළි පදනම මත ජලයේ දිය නොවන ද්‍රව්‍ය ප්‍රමාණය සියයට එකකට (1.0%) (m/m) වඩා වැඩියෙන් අඩංගු නොවිය යුතු ය;

(ආ) වියළි පදනම මත සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) සියයට අනූහතකට (97%) (m/m) නොඅඩු විය යුතු ය.

## II වන කොටස

### අයඩීනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු

8. (1) කිසිදු තැනැත්තකු විසින්, තත්කාර්යය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් මත අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව අයඩීනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය, ආනයනය, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපනියෝගයේ සඳහන් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් -

(අ) මෙහි IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කළ යුතු ය; සහ

(ආ) අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ලේඛනවලින් සමන්විත විය යුතු ය.

(3) (අ) අධ්‍යක්ෂවරයා විසින් (4) වන උපනියෝගයට අනුකූලව ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ හැකි ය.

(ආ) අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී, එම ප්‍රතික්ෂේප කිරීම, එයට හේතු වූ කරුණු සමග ඉල්ලුම් පත්‍රය ලැබුණු දින සිට දින තිහක් (30) ඇතුළත ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් -

(අ) මෙහි V වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය; සහ

(ආ) කලින් ඒ සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කර හෝ අවලංගු කර නැත්නම් මිස සහ එහි නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසිවලට යටත් ව, ඒ සහතිකය නිකුත් කළ දින සිට වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(5) ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් -

(අ) මෙහි IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ම, පවත්නා ලියාපදිංචි කිරීමේ සහතිකයේ කාලය ඉකුත්වීමට දින අනූවකට (90) පෙරාතුව ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ලේඛනවලින් සමන්විත විය යුතු ය.

(6) අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය මත පිටසනක් යෙදීමෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම සිදුකරනු ලැබිය යුතු ය.

9. ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන්නකු විසින්, ඔහුගේ ලියාපදිංචි අංකය, නම සහ ලිපිනය -

(අ) එම ක්‍රියාකාරකම් සඳහා අවසර දී ඇති සියලු ම ස්ථානවල; සහ

(ආ) සියලු නිෂ්පාදනයන්හි ලේබල්වල ප්‍රධාන රාමුවේ,

කැපී පෙනෙන ලෙස සහ නොමැකෙන ලෙස ප්‍රදර්ශනය කිරීම සිදු කළ යුතු ය.

10. අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණුවල මෙහි VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූල වූ ආහාරයට යෝග්‍ය පොටෑසියම් අයඩේට් ($KIO_3$) අඩංගු විය යුතු ය.

එසේ වුව ද, ආහාර උපදේශක කමිටුවේ නිර්දේශය මත ප්‍රධාන ආහාර බලධරයා විසින් මහජන සෞඛ්‍යයට වැදගත් යයි සලකනු ලබන, නිර්දේශිත ප්‍රමාණයන්ගෙන් වෙනත් සවිබල කාරක එකතු කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය. ලුණු කුඩු වශයෙන් වන විට සිලිකන් ඩයොක්සයිඩ් (INS 551) හෝ ආහාර උපදේශක කමිටුවේ නිර්දේශය මත ප්‍රධාන ආහාර බලධරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් ප්‍රතිකැටිකිරීමේ කාරකයක් අඩංගු කළ හැකි ය.

11. අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණුවල -

(අ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.5කට (0.5 mg/kg) වඩා ආසනික් (As):

(ආ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.5කට (0.5 mg/kg) වඩා කැඩ්මියම් (Cd):

(ඇ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් දෙකකට (2.0 mg/kg) වඩා ඊයම් (Pb): සහ

(ඈ) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.1කට (0.1 mg/kg) වඩා රසදිය (Hg),

අඩංගු නොවිය යුතු ය.

12. කුඩු වශයෙන් වූ අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණුවල -

(අ) (i) තෙතමනය සියයට 0.5කට (0.5%) (m/m) වඩා; සහ

(ii) වියළි පදනම මත ජලයේ දිය නොවන ද්‍රව්‍ය සියයට 0.5 කට (0.5%) (m/m) වඩා අඩංගු නොවිය යුතු ය;

(ආ) වියළි පදනම මත සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) සියයට අනූඅටකට (98%) (m/m) නොඅඩු විය යුතු ය;

(ඇ) අවම වශයෙන් සියයට අනූපහක් (95%) (m/m), මිලිමීටර් එකක (1mm) {B.S. 16} සිදුරු සහිත පෙනේරයක් තුළින් ගමන් කරවීමට හැකිවිය යුතු ය.

(ඈ) වියළි පදනම මත, සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) හැර ජලයේ දියවන ද්‍රව්‍ය සියයට එකකට (1%) (m/m) වඩා අඩංගු නොවිය යුතු ය; සහ

(ඉ) වියළි පදනම මත, නිෂ්පාදන හෝ ආනයන මට්ටමේ දී කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් තිස්පහකට (35 mg/kg) වඩා වැඩියෙන් අයඩීන් (I) අඩංගු නොවිය යුතු අතර සිල්ලර විකුණුම් මට්ටමේ දී කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් පහළොවකට (15 mg/kg) වඩා අඩුවෙන් අයඩීන් (I) අඩංගු නොවිය යුතු ය.

13. අයඩිනීකරණය කළ කැට වශයෙන් පවත්නා ආහාරයට ගන්නා ලුණුවල -

(අ) (i) තෙතමනය සියයට හයකට (6%) (m/m) වඩා වැඩියෙන්;

(ii) වියළි පදනම මත ජලයේ දිය නොවන ද්‍රව්‍ය සියයට 0.5කට (0.5%) (m/m) වඩා වැඩියෙන්; සහ

(iii) වියළි පදනම මත සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) හැර ජලයේ දියවන ද්‍රව්‍ය සියයට දෙකකට (2.0%) (m/m) වඩා වැඩියෙන්,

අඩංගු නොවිය යුතු ය.

(ආ) වියළි පදනම මත සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) සියයට අනූහතකට (97%) (m/m) වඩා නොඅඩු විය යුතු ය.

(ඇ) වියළි පදනම මත, සිල්ලර විකුණුම් මට්ටමේ දී අයඩීන් (I) කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් පහළොවකට (15 mg/kg) නොඅඩුව සහ නිෂ්පාදනයේ දී හෝ ආනයන මට්ටමේ දී කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් තිස්පහකට (35 mg/kg) වඩා වැඩියෙන් අයඩීන් (I) අඩංගු නොවිය යුතු ය; සහ

(ඈ) අවම වශයෙන්, සියයට අසූවක (80%) (m/m) ප්‍රමාණයේ මිලිමීටර් 4.75ක (4.75 mm) {B.S. 4} සිදුරු සහිත පෙනේරයක් තුළින් ගමන් කරවීමට හැකි සහ මිලිමීටර 1ක (1 mm) {B.S. 16} සිදුරු සහිත පෙනේරයක් තුළින් ගමන් කරන විට සියයට අනූපහක් (95%) (m/m) රඳවා ගත හැකි විය යුතු ය.

## III වන කොටස

### පොදු

14. ආහාරයට ගන්නා ලුණු (අයඩිනීකරණය කළ සහ අයඩිනීකරණය නොකළ) වායුරොධක, විනිවිද පෙනෙන ආහාර සඳහා යෝග්‍ය ඇසුරුම්වල හෝ බහාලුම්වල ඇසුරුම් කරනු ලැබිය යුතු අතර ඇසුරුම් ද්‍රව්‍ය පොලිතීන් වන විට ඒ ද්‍රව්‍යයේ ඝනකම මයික්‍රොමීටර් 75කට (75 μm) වඩා නොඅඩු විය යුතු යඃ

එසේ වුව ද, මේ නියෝගය මේසය මත තබන ඉසින භාජනවල බහා කුඩු වශයෙන් තබා ඇති අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණුවලට අදාළ නොවිය යුතු ය.

15. (1) අවස්ථාවෝචිත පරිදි, "කෑමට ගන්නා ලුණු කැට" හෝ "කෑමට ගන්නා ලුණු කුඩු" ලෙස නිෂ්පාදනයේ පොදු නාමය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ආහාරයට ගන්නා ලුණු අඩංගු යම් ඇසුරුමක හෝ බහාලුමක ප්‍රධාන රාමුවේ ලේබලය මත නොමැකෙන ලෙස සඳහන් කළ යුතු ය.

(2) අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු අඩංගු යම් ඇසුරුමක ප්‍රධාන රාමුවේ ලේබලය මත පහත දැක්වෙන පාඨ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් නොමැකෙන ලෙස සහ පැහැදිලිව කියවිය හැකි පරිදි සලකුණු කර හෝ මුද්‍රණය කර තිබිය යුතු යඃ-

(අ) අවස්ථාවෝචිත පරිදි, "අයඩිනීකරණය කළ කෑමට ගන්නා ලුණු කැට" හෝ "අයඩිනීකරණය කළ කෑමට ගන්නා ලුණු කුඩු" ලෙස නිෂ්පාදනයේ පොදු නාමය;

(ආ) "නොසෝදා භාවිත කරන්න"; සහ

(ඇ) "හිරු එළිය සහ තාපය ඇති ස්ථානවලින් බැහැරව ගබඩා කරන්න".

16. ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා සහ එහි අලුත් කිරීම සඳහා අදාළ වන ගාස්තු මෙහි VII වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගෙවිය යුතු ය.

17. 2005 අගෝස්තු මස 11 වන දින අංක 1405/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 ආහාර (ලුණු අයඩිනීකරණය කිරීමේ) නියෝග එය යටතේ කලින් නිත්‍යානුකූලව සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

## IV වන කොටස

## අර්ථ නිරූපණය

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"පනත" යන්නෙන්, 1980 අංක 26 දරන ආහාර පනත අදහස් වේ;

"ප්‍රධාන ආහාර බලධරයා" යන්නෙන්, පනතේ 11 වන වගන්තිය යටතේ නම් කර ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"සාමාන්‍ය ලුණු" යන්නෙන්, මුහුදු ජලය වාෂ්පීකරණය කිරීම මගින් සහ එහි අපද්‍රව්‍ය සෝදා ඉවත් කිරීම මගින් ලබාගන්නා ලද වියළි ද්‍රව්‍යයක් වීම මත පදනම්ව බරින් සියයට අනූ හතක ප්‍රතිශතයකට (97%) නොඅඩු සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl) ප්‍රතිශතයක් අඩංගු වන වර්ණයෙන් සුදු හෝ අවසුදු වර්ණයෙන් යුතු මැටි, සියුම් වැලි, සිප්පි කටු හා වෙනත් පරිබාහිර ද්‍රව්‍ය වැනි දෘශ්‍යමාන අපද්‍රව්‍යවලින් තොර ලුණු ස්වරූපයක් වේ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"ආහාර උපදේශක කමිටුව" යන්නෙන්, පනතේ 8 වන වගන්තිය යටතේ පත් කරන ලද ආහාර උපදේශක කමිටුව අදහස් වේ;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ පරිදි එම අර්ථයම තිබිය යුතු ය; සහ

"තැනැත්තා" යන්නෙන්, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

I වන උපලේඛනය

[3(2)(අ), 3(5)(අ) වන නියෝග]

**අයඩිනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු, ලේවායන්වල නිෂ්පාදනය සහ ගබඩා කිරීම/ අයඩිනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු හෝ සාමාන්‍ය ලුණු කර්මාන්තශාලාවල කාර්යයන් සඳහා ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ භාවිත කිරීම/ අයඩිනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු ඔසුහල්වල විකිණීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :- ..............................................................

   ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................................................

2. තනතුර :- ..............................................................

3. ලිපිනය :- ..............................................................

   දුරකථන අංකය :- .............................................. විද්‍යුත් ලිපිනය :- ..............................................

4. ඉල්ලුම් පත්‍රයේ කාර්යයන් :-

   (කරුණාකර කියවා අදාළ අංකයට ( √ ) ලකුණ දමන්න

   (i) ලුණු ලේවායන් තුළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය කිරීම සඳහා

   (ii) ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු ආනයනය, ප්‍රවාහනය සහ ගබඩා කිරීම සඳහා

   (iii) ආහාරයට ගන්නා ලුණු, ලේවායන් තුළ ගබඩා කිරීම සඳහා

   (iv) කර්මාන්තශාලාවල කාර්යයන් සඳහා ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු භාවිතය සඳහා

   (v) වෛද්‍ය නිර්දේශය මත ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු සිල්ලර විකිණීම සඳහා

5. අ. කර්මාන්තයේ/ ඔසුහලේ වර්ගය/ නාමය :- ..............................................................

   ආ. කර්මාන්තය/ ගබඩාව පිහිටි ස්ථානයේ ලිපිනය :- ..............................................................

6. ව්‍යාපාරයේ / සමාගමේ ලියාපදිංචි කිරීමේ අංකය :- ..............................................................
   (ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න)

7. වෙළෙඳාමේ ස්වභාය :- (උදා :- රජයේ/ පෞද්ගලික/ වගකීමෙන් සීමිත සමාගම) :- ..............................................

8. නිෂ්පාදනයේ වෙළෙඳ නාමය (නාම) :- ..............................................................

9. සමාගමේ නම සහ ලිපිනය :- ..............................................................

10. අයිතිකරුගේ/ අධ්‍යක්ෂ මණ්ඩලයේ නාමය සහ ලිපිනය :- ..............................................................

11. පෙර ලියාපදිංචි අංකය සහ දිනය (ඇත්නම්) :- ..............................................................

12. වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය (මෙට්‍රික් ටොන්) :- ..............................................................

13. නිෂ්පාදනය කළ/ විකුණන ලද නිෂ්පාදනයේ නම :- ..............................................................

14. නිෂ්පාදනයේ මිශ්‍රණයක් ලෙස භාවිත කරන ආහාරයට ගන්නා ලුණුවල ප්‍රතිශතය :- ..............................................
    ..............................................................

15. අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු භාවිත නොකළ යුත්තේ/ භාවිත කිරීමට අවශ්‍ය නොවන්නේ මන් ද?
    යන්නට හේතු :- ..............................................................

16. ආහාරයට ගන්නා ලුණුවල ඇස්තමේන්තුගත වාර්ෂික අවශ්‍යතාවය :- ..................................................................................

17. දී ඇති කාලසීමාව තුළ බලාපොරොත්තු වන ආහාරයට ගන්නා ලුණු තොග ප්‍රමාණය :- ................................................................ ..........................................................................................................................................................................................

දිනය :- ....................................................................

..........................................................................
අයදුම්කරුගේ අත්සන

සමාගමේ නිල මුද්‍රාව

---

**කාර්යාලයීය භාවිතය සඳහා පමණි**

ලියාපදිංචි ගාස්තු (කාර්යාලයීය භාවිතය සඳහා)

රු. :- ............................................ ලදුපත් අංකය :- .................................................... දිනය :- ................................................................

**ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයාගේ සහතිකය**

1. මා විසින් ඉල්ලුම්කරු ඉහත කර්මාන්තය කරගෙන යන්නා වූ පරිශ්‍රය නිසි ආකාරයෙන් පරීක්ෂා කර ඔහුගේ ප්‍රකාශය සනාථ කර ඇත.

2. ඉල්ලුම්කරු විසින් සපයන ලද ප්‍රකාශ සත්‍ය හා නිවැරදි වේ.

3. ඉල්ලුම්කරුට ඔහුගේ/ ඇයගේ කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යාම සඳහා මසකට ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු කිලෝග්‍රෑම් .................................... ප්‍රමාණයක් අවශ්‍ය වේ.

4. සටහන් :-

ආහාර සහ ඖෂධ පරීක්ෂක

දිනය :-

කාර්යාලයීය නිල මුද්‍රාව

**සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය (ආහාර පාලන පරිපාලන ඒකකය)**

නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි

දිනය :-

සහකාර අධ්‍යක්ෂ
(ආහාර පාලන පරිපාලන ඒකකය)

**අධ්‍යක්ෂවරයාගේ අනුමතය (ආහාර පාලන පරිපාලන ඒකකය)**

අනුමත කරමි / අනුමත නොකරමි

දිනය :-

ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂ

II වන උපලේඛනය

[3(4)(අ) වන නියෝගය]

**අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු ලේවායන් තුළ නිෂ්පාදනය සහ ගබඩා කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ අංකය :- .......................................................... ලියාපදිංචි කිරීමේ දිනය :- ...................................................................

1980 අංක 26 දරන ආහාර පනතේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් කරන ලද ඉල්ලුම්කරු අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය/ ගබඩා කිරීමේ කාර්යයන් සඳහා මෙයින් ලියාපදිංචි කරනු ලැබේ.

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :-

.................................................................................................................................................................................................

.................................................................................................................................................................................................

2. ලුණු ලේවායන් පිහිටි ස්ථාන :- ...........................................................................................................................................

.................................................................................................................................................................................................

3. ලුණු ලේවායන්වල මුළු ඉඩම් ප්‍රමාණය (අක්කර) :-

.................................................................................................................................................................................................

කොන්දේසි :-

1. ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය කරන / ගබඩා කරන සියලු තැනැත්තන් 2023 ආහාර (ලුණු අයඩීනීකරණය කිරීමේ) නියෝගවලට අනුකූල විය යුතු ය.

2. මේ ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නා විසින් නිෂ්පාදනවල (කි. ග්‍රෑ) වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

3. මේ ලියාපදිංචි කිරීමේ සහතිකය ......................................................... දින සිට වසරක කාලසීමවක් සඳහා වලංගු විය යුතු ය.

.................................................................

ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂ

III වන උපලේඛනය

[3(4)(ආ) වන නියෝගය]

**කර්මාන්තශාලාව කාර්යයන් සඳහා අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු හෝ සාමාන්‍ය ලුණු ආනයනය/ ප්‍රවාහනය/ ගබඩා කිරීම/ භාවිත කිරීම හෝ අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු ලියාපදිංචි ඔසුසල්වල විකිණීම ලියාපදිංචි කිරීම සඳහා වූ සහතිකය**

............................................ හි, පිහිටා ඇති ................................................ නම දරන කර්මාන්ත ශාලාවේ/ ඔසුහලේ ................................. .................... වන ....................................................... හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක .......................................................................... දරන .................................................... මයා/ මිය/ මෙනෙවිය වෙත 2023 අංක .................................................. දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2023 ආහාර/ලුණු අයඩීනීකරණය කිරීමේ) නියෝගවලට අනුකූලව අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු/ සාමාන්‍ය ලුණු කිලෝග්‍රෑම් .................................................... ප්‍රමාණයක් ආනයනය/ ප්‍රවාහනය / ගබඩාකිරීම සඳහා සහ ඉහත සඳහන් කරන ලද ඔහුගේ/ ඇයගේ කර්මාන්ත ශාලාවේ/ ඔසුහලේ භාවිතා සඳහා යම් දෙන ලද කාලසීමාවක දී අයඩීනීකරණය නොකළ ආහාරයට ගන්නා ලුණු/ සාමාන්‍ය ලුණු කිලෝග්‍රෑම් ............................................ ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා මෙයින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

මෙම සහතිකය .................................................................. (දිනය) සිට වසරක (1) කාලසීමාවක් සඳහා වලංගු වේ.

දිනය :-

ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂ

සටහන :-

1. ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු එකී ප්‍රමාණයෙන් නිකුත් කරන යම් ලුණු නිෂ්පාදකයකු විසින් සහතිකය දරන්නාට නිකුත් කළ ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු පිළිබඳව නොමැකෙන තීන්තෙන් අදාළ සහතිකයේ ප්‍රධාන කොටසේ දැක්විය යුතු අතර නිකුත් කළ දිනය ද සඳහන් කළ යුතු ය. ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු ආනයනය සම්බන්ධයෙන් වූ කාරණාවක දී ඒවා නිදහස් කරන කාලය තුළ ද සහතික කිරීම සහ පිටසන් යෙදීම සඳහා ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයට (IFIU) සහතිකය ඉදිරිපත් කළ යුතුය.

2. මිල දී ගත් / ආනයනය කළ ලුණු තොගය ඒ දිනයේ ම ප්‍රවාහනය කර නොමැති නම්, එයට බලපාන පිටසන, ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු නිකුත් කරන ආයතනය විසින් හෝ ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු ආනයනය සම්බන්ධයෙන් වූ කාරණවක දී ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයේ (IFIU) නිලධරයකු විසින් අදාළ සහතිකයේ ප්‍රධාන කොටසේ යෙදිය යුතු ය. එවැනි පිටසනක් නොමැති සහතිකයක්, වරායෙන් ඒ ආහාරයට ගන්නා ලුණු / සාමාන්‍ය ලුණු මිල දී ගත් හෝ නිදහස් කරගත් දිනයේ ම මිස වෙනත් යම් දිනවල දී ඒවා ප්‍රවාහනය කිරීම සඳහා වලංගු නොවිය යුතු ය.

(සහතිකයේ අනෙක් පිට)

බලයලත් ලුණු නිෂ්පාදකයා විසින් හෝ ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයේ (IFIU) බලයලත් නිලධරයා විසින් පිරවිය යුතු ය.

| ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනෙක් පිටුවේ නිශ්චිතව සඳහන් කරන ලද ලුණු ප්‍රමාණය | නිකුත් කළ/ ආනයනය කළ ප්‍රමාණය | දිනය | නිකුත් කළ යුතු ශේෂය | වාහන අංකය සහ ප්‍රවාහනය කරන දිනය | ගමනාන්තය | ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයේ (IFIU) බලයලත් නිලධරයාගේ හෝ නිකුත් කරන නිලධරයගේ අත්සන | නිල මුද්‍රාව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

IV වන උපලේඛනය

[8(2)(අ), 8(5)(අ) වන නියෝග]

**අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය/ ගබඩා කිරීම/ ආනයනය/ප්‍රවාහනය හෝ ඇසුරුම් කිරීම, ලියාපදිංචි කිරීම සඳහා හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :- ..........

   ජාතික හැඳුනුම්පත් අංකය :- ..........

2. තනතුර :- ..........

3. ලිපිනය :- ..........

   දුරකථන අංකය :- .......... විද්‍යුත් ලිපිනය :- ..........

4. ඉල්ලුම් කිරීමේ අරමුණ :-

   (කරුණාකර කියවා අදාළ අංකයට ( √ ) ලකුණ දමන්න)

   (i) ආහාරයට ගන්නා ලුණු අයඩිනීකරණය සඳහා

   (ii) අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීම සඳහා

   (iii) අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු ආනයනය කිරීම සඳහා

   (iv) අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු ගබඩා කිරීම සඳහා

5. අ. කර්මාන්තයේ වර්ගය/ නාමය :- ..........
   ආ. කර්මාන්තය/ ගබඩාව පිහිටි ස්ථානයේ ලිපිනය :- ..........

6. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය :- ..........
   (ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න)

7. වෙළෙඳාමේ ස්වභාවය :- (උදා :- රජයේ/ පෞද්ගලික/ වගකීමෙන් සීමිත සමාගම්) ..........

8. නිෂ්පාදනයේ වෙළෙඳ නාමය (නාමයන්) :- ..........

9. සමාගමේ නම සහ ලිපිනය :- ..........

10. අයිතිකරුගේ/ අධ්‍යක්ෂ මණ්ඩලයේ නාමය සහ ලිපිනය :- ..........

11. පෙර ලියාපදිංචි අංකය සහ දිනය (ඇත්නම්) :- ..........

12. වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය (මෙට්‍රික් ටොන්) :- ..........

දිනය :- .......... ..........
අයදුම්කරුගේ අත්සන

සමාගමේ නිලමුද්‍රාව

---

**කාර්යාලයීය භාවිතය සඳහා පමණි**

ලියාපදිංචි කිරීමේ ගාස්තු (කාර්යාලයීය භාවිතය සඳහා)

රු. :.......... ලදුපත් අංකය :.......... දිනය :..........

**ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයාගේ සහතිකය**

1. මා විසින් ඉල්ලුම්කරු ඉහත කර්මාන්තය කරගෙන යන්නා වූ පරිශ්‍රය නිසි ආකාරයෙන් පරීක්ෂා කර ඔහුගේ ප්‍රකාශය සනාථ කර ඇත.

2. ඉල්ලුම්කරු විසින් සපයන ලද ප්‍රකාශ සත්‍ය හා නිවැරදි වේ.

3. ඉල්ලුම්කරුට ඔහුගේ/ඇයගේ කර්මාන්තය සාර්ථකව කරගෙන යාම සඳහා මාස ............. කට ආහාරයට ගන්නා ලුණු කිලෝග්‍රෑම් ......................... අවශ්‍ය වේ.

4. සටහන් :

ආහාර සහ ඖෂධ පරීක්ෂක

දිනය :

නිල මුද්‍රාව

**සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය (ආහාර පාලන පරිපාලන ඒකකය)**

නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි

දිනය :

සහකාර අධ්‍යක්ෂ
(ආහාර පාලන පරිපාලන ඒකකය)

**ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂවරයාගේ අනුමතය**

අනුමත කරමි/අනුමත නොකරමි

දිනය :

ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂ

## V වන උපලේඛනය

[8(4)(අ) වන නියෝගය]

### අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු සඳහා වූ ලියාපදිංචි කිරීමේ සහතිකය

### I වන කොටස

ලියාපදිංචි කිරීමේ අංකය :-............................................................................ ලියාපදිංචි කිරීමේ දිනය ............................................................

1980 අංක 26 දරන ආහාර පනතේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් කරන ලද ඉල්ලුම්කරු අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය/ ආනයනය / ඇසුරුම් කිරීම/ ගබඩා කිරීමේ කාර්යයන් සඳහා මෙයින් ලියාපදිංචි කරනු ලැබේ.

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :-
   ....................................................................................................................................................................
   ....................................................................................................................................................................

2. අයඩිනීකරණ පහසුකම් ඇති ස්ථානය :-
   ....................................................................................................................................................................
   ....................................................................................................................................................................

3. නිෂ්පාදනයේ වෙළෙඳ නාමය (නාමයන්) :-
   ....................................................................................................................................................................

කොන්දේසි :-

1. අයඩිනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය කරන/ ආනයනය කරන/ ඇසුරුම් කරන/ ගබඩා කරන සියලු තැනැත්තන් 2023 ආහාර (ලුණු අයඩිනීකරණය කිරීමේ) නියෝගවලට අනුකූල විය යුතු ය.

2. මේ ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නා විසින් එක් එක් කාණ්ඩයේ සහ සියලු කාණ්ඩවල රසායනාගාර වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

3. මේ ලියාපදිංචි කිරීමේ සහතිකය ................................................................. දින සිට වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

....................................................

ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂ

## II වන කොටස

**අයඩීනීකරණය කළ ආහාරයට ගන්නා ලුණු නිෂ්පාදනය/ ආනයනය/ ගබඩා කිරීම/ ඇසුරුම් කිරීම/ ප්‍රවාහනය සඳහා වූ ලිඛිත අවසරය**

................................. හි පිහිටා ඇති ................................................................ නම දරන කර්මාන්ත ශාලාවේ/ ඔසුහලේ .......................... ..... වන ....................................... හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක .................................... දරන .................................... මයා/ මිය/ මෙනෙවිය වෙත 2023 අංක .................................... දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2023 ආහාර (ලුණු) අයඩීනීකරණය කිරීමේ) නියෝගවලට අනුකූලව ඉහත සඳහන් කරන ලද ඔහුගේ/ ඇයගේ කර්මාන්තයේ භාවිතය සඳහා යම් දෙන ලද කාලසීමාවක දී ආහාරයට ගන්නා ලුණු කිලෝ/ග්‍රෑම්................................. ප්‍රමාණයක් නිෂ්පාදනය/ ආනයනය/ගබඩා කිරීම/ ඇසුරුම් කිරීම/ ප්‍රවාහනය සඳහා සහ ආහාරයට ගන්නා ලුණු කිලෝග්‍රෑම් ............................... ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා මෙයින් අවසරය ප්‍රදානය කරනු ලැබේ.

මෙම සහතිකය ................................................................ (දිනය) සිට වසරක කාලසීමාවක් සඳහා වලංගු වේ.

ආහාර පාලන පරිපාලන ඒකකය භාර අධ්‍යක්ෂ

දිනය ඃ

සටහන ඃ-

1. ආහාරයට ගන්නා ලුණු එකී ප්‍රමාණයෙන් නිකුත් කරන යම් ලුණු නිෂ්පාදකයකු විසින් සහතිකය දරන්නාට නිකුත් කළ ආහාරයට ගන්නා ලුණු ප්‍රමාණය පිළිබඳව නොමැකෙන තීන්තෙන් අදාළ ලිඛිත අවසරයේ ප්‍රධාන කොටසේ දැක්විය යුතු අතර නිකුත් කළ දිනය ද සඳහන් කළ යුතු ය. ආහාරයට ගන්නා ලුණු ආනයනය සම්බන්ධයෙන් වූ කාරණාවක දී ඒවා නිදහස් කරන කාලය තුළ දී සහතික කිරීම සහ පිටසන් යෙදීම සඳහා ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයට (IFIU) ලිඛිත අවසරය ඉදිරිපත් කළ යුතු ය.

2. මිල දී ගත්/ ආනයනය කළ ලුණු තොගය ඒ දිනයේ ම ප්‍රවාහනය කර නොමැති නම්, එයට බලපාන පිටසන ආහාරයට ගන්නා ලුණු නිකුත් කරන ආයතනය විසින් හෝ ආහාරයට ගන්නා ලුණු ආනයනය සම්බන්ධයෙන් වූ කාරණාවක දී ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයේ (IFIU) නිලධරයකු විසින් අදාළ ලිඛිත අවසරයේ ප්‍රධාන කොටසේ යෙදිය යුතු ය. එවැනි සඳහනක් නොමැති ලිඛිත අවසරයක්, වරායෙන් එම ආහාරයට ගන්නා ලුණු මිල දී ගත් හෝ නිදහස් කරගත් දිනයේ ම මිස වෙනත් යම් දිනවල දී ඒවා ප්‍රවාහනය කිරීම සඳහා වලංගු නොවිය යුතු ය.

**(සහතිකයේ අනෙක් පිට)**

**බලයලත් ලුණු නිෂ්පාදකයා විසින් හෝ ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයේ (IFIU) බලයලත් නිලධරයා විසින් පිරවිය යුතුයා**

| ලිඛිත අවසරයේ අනෙක් පිටුවේ නිශ්චිතව සඳහන් කරන ලද ලුණු ප්‍රමාණය | නිකුත් කළ/ ආනයනය කළ ප්‍රමාණය | දිනය | නිකුත් කළ යුතු ශේෂය | වාහන අංකය සහ ප්‍රවාහනය කරන දිනය | ගමනාන්තය | ආනයනික ආහාර පරීක්ෂණ ඒකකයේ (IFIU) බලයලත් නිලධරයාගේ හෝ නිකුත් කරන නිලධරයාගේ අත්සන | නිල මුද්‍රාව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

## VI වන උපලේඛනය

[10 වන නියෝගය]

### ආහාරයට ගන්නා පොටෑසියම් අයඩේට් සඳහා වූ ප්‍රමිතීන්

1. ආහාරයට ගන්නා පොටෑසියම් අයඩේට් අපිරිසිදු ද්‍රව්‍යයන්ගෙන් තොර ස්ඵටිකමය යුතු කුඩක් විය යුතු අතර -

(අ) සියයට අනූනවයකට වඩා (99%) (m/m) පොටෑසියම් අයඩේට් ($KIO_3$) අඩංගු විය යුතු අතර; සහ

(ආ) (i) සියයට 0.01 (0.01%) (m/m) බ්‍රෝමේට්, බ්‍රෝමයිඩ්, ක්ලෝරේට් සහ ක්ලෝරයිඩ් ($Cl^-$);

(ii) සියයට 0.002 (0.002%) (m/m) අයඩයිඩ් ($I^-$);

(iii) ඊයම් (Pb), කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් දෙකකට (2 mg/kg); සහ

(iv) ආසනික් (As), කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් තුනකට (3 mg/kg),

වඩා අඩංගු නොවිය යුතු ය.

2. වියළීමේ දී අඩුවන පොටෑසියම් අයඩේට් ප්‍රමාණය සියයට 0.5 (0.5%) කට නොවැඩි විය යුතු අතර සියයට පහක (5%) (m/m) ද්‍රාවණයක ආහාරයට ගන්නා පොටෑසියම් අයඩේට් පී.එච් (pH) අගය 5.5 - 9.0 අතර විය යුතු ය.

## VII වන උපලේඛනය

[16 වන නියෝගය]

### ගාස්තු

(1) වාර්ෂික නිෂ්පාදන හෝ ඇසුරුම් ධාරිතාවට අදාළ වන පරිදි ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම සහ එය අලුත් කිරීම සඳහා පහත දැක්වෙන ගාස්තු ගෙවිය යුතු යඃ-

| වාර්ෂික නිෂ්පාදන හෝ ඇසුරුම් ප්‍රමාණය | ගාස්තුව |
|---|---|
| මෙට්‍රික් ටොන් 1,000 (මෙ.ටො) සහ ඊට අඩු | රු. 5,000/- |
| මෙට්‍රික් ටොන් 1,001 (මෙ.ටො) සහ 5,000 දක්වා | රු. 10,000/- |
| මෙට්‍රික් ටොන් 5,001 (මෙ.ටො) සහ ඊට වැඩි | රු. 25,000/- |

(2) මුල් සහතිකය හානි වී හෝ නැති වී ඇත්නම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් සඳහා රුපියල් දෙදහසක (රු. 2,000/-) ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු අතර "අනුපිටපත" යන වචන ඒ සහතිකයේ පිටපතේ සඳහන් කළ යුතු ය.

EOG 05- 0108

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.